# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2096/25 - 2018 නොවැම්බර් මස 07 වැනි බදාදා - 2018.11.07**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43 වැනි ව්‍යවස්ථාව යටතේ පත්කරන ලද අමාත්‍යවරුන් සඳහා පවරනු ලබන විෂයයන් හා කාර්යයන් සහ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතන නිශ්චය කර ඇති හෙයින් ;

එකී අමාත්‍යවරයන් භාරයේ පවත්නා විෂයයන්, කාර්යයන්, දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතන මෙම නිවේදනයේ දිනයේ සිට මෙහි පහත දැක්වෙන උපලේඛනයෙහි පරිදි පවත්නා බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති.

2018 නොවැම්බර් මස 07 වැනි දින,
ජනාධිපති කාර්යාලය,
කොළඹ 01.

**උපලේඛනය**

**(1) සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍ය**

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති හා අණ පනත්* |
|---|---|---|
| 1. සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතනයන් හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම | 1. සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව<br>2. ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල<br>3. විජය කුමාරණතුංග අනුස්මරණ රෝහල<br>4. රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව<br>5. රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව<br>6. සියලුම ජාතික, ශික්ෂණ හා නිශ්චිත රජයේ රෝහල් | • විලවුන්, උපකරණ සහ ඖෂධ පනත (1980 අංක 27)<br>• සෞඛ්‍ය සේවා පනත (1952 අංක 12)<br>• වෛද්‍ය ආඥාපනත (1927 අංක 26)<br>• වෛද්‍ය අවශ්‍යතා ආඥාපනත (1912 අංක 9) |


1A - G 27792 — 372 (2018/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*උපලේඛනය (සම්බන්ධිතයි)*

**(1) සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍ය** *(සම්බන්ධිතයි)*

*I වැනි තීරුව*

*කාර්යයන් හා කර්තව්‍යයන්*

2. සියලුම රෝහල් හා එම රෝහල්වල සේවයේ නියුක්ත කාර්ය මණ්ඩල කළමනාකරණය (පළාත් සභා යටතේ වන ඒවා හැර)
3. වෛද්‍ය සහ පරිපූරක වෛද්‍ය සේවාවන්හි ගුණාත්මකභාවය සහ කුසලතා ඉහළ නැංවීම සඳහා අවශ්‍ය වන පුහුණු අවස්ථා පුළුල් කිරීම සම්බන්ධ කටයුතු
4. ශ්‍රී ලංකා වෛද්‍ය සේවයේ පරිපාලනය හා පිරිස් කළමනාකරණය
5. ජාතික සෞඛ්‍ය රක්ෂණ වැඩසටහනට අදාළ කටයුතු
6. පෞද්ගලික රෝහල් සහ වෛද්‍ය මධ්‍යස්ථානවල ගුණාත්මකභාවය ප්‍රමිතිය හා මිල ගණන් නියාමනය හා අධීක්ෂණ කටයුතු
7. පුණ්‍යාධාර වෛද්‍ය ආයතන නියාමනය හා අධීක්ෂණය කිරීම
8. වසංගත, බෝවන රෝග සහ බෝ නොවන රෝග පැතිරීම පාලනය, වැළැක්වීම සහ නිවාරණයට අවශ්‍ය පියවර ගැනීම
9. ජාත්‍යන්තර නිරෝධායන සහ සනීපාරක්ෂණයට අදාළ නීතිරීති ක්‍රියාත්මක කිරීම
10. මහජන සෞඛ්‍ය සේවාවන් සඳහා අවශ්‍ය වන ප්‍රතිපත්ති හා ප්‍රමිතීන් සකස් කිරීම
11. බෙහෙත් වර්ග නිෂ්පාදනය, ආනයනය සහ බෙදාහැරීම සම්බන්ධ කටයුතු
12. පාසල් සෞඛ්‍ය කටයුතු සහ දන්ත වෛද්‍ය සේවා ක්‍රියාත්මක කිරීම
13. පොදු සනීපාරක්ෂාව සහ දුම්රිය සේවා සනීපාරක්ෂාව
14. වතු අංශයේ සෞඛ්‍ය කටයුතු
15. ජාතික රුධිර පාරවිලයන සේවා සම්බන්ධ කටයුතු

*II වැනි තීරුව*

*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා*

7. ජාතික සෞඛ්‍ය සභාව
8. වෛද්‍ය පර්යේෂණ ආයතනය
9. ජාතික සෞඛ්‍ය විද්‍යායතනය
10. අෂ්රොෆ් අනුස්මරණ රෝහල
11. වෛද්‍ය රසායනාගාර තාක්ෂණ පාසල
12. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව
13. ශ්‍රී ලංකා වෛද්‍ය විද්‍යාල සභාව
14. ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල
15. පෞද්ගලික වෛද්‍ය ආයතන සභාව
16. ජාතික වෘක්කවේදී, කාන්දු පෙරීම, හා බද්ධ කිරීමේ ආයතනය
17. සීමාසහිත ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම
18. දුම්කොළ සහ මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය
19. ආයුර්වේද දෙපාර්තමේන්තුව
20. ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව
21. ආයුර්වේද වෛද්‍ය සභාව
22. ආයුර්වේද විද්‍යාල සහ රෝහල් මණ්ඩලය
23. ආයුර්වේද ශික්ෂණ රෝහල්
24. හෝමියෝපති රෝහල වැලිසර
25. හෝමියෝපති වෛද්‍ය සභාව

*III වැනි තීරුව*

*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්*

- මනෝරෝග ආඥාපනත (1870 අංක 1)
- දුම්කොළ සහ මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනත (2006 අංක 27)
- ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල පනත (1981 අංක 13)
- සාත්තු නිවාස (නියාමනය) කිරීමේ පනත (1949 අංක 16)
- විෂ වර්ග, අබිං සහ අන්තරායක ඖෂධ වර්ග ආඥාපනත (1929 අංක 17)
- පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාපදිංචි කිරීමේ) පනත (2006 අංක 21)
- ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල් මණ්ඩල පනත (1983 අංක 54)
- ශ්‍රී ලංකා හෙද සභා පනත (1988 අංක 19)
- මනුෂ්‍ය පටක බද්ධ කිරීමේ පනත (1987 අංක 48)
- විජය කුමාරණතුංග අනුස්මරණ රෝහල් මණ්ඩල පනත (1999 අංක 38)
- ආයුර්වේද පනත (1961 අංක 31)
- හෝමියෝපති පනත (1970 අංක 7)
- 2018 අංක 18 දරන 1990 සුවසැරිය පදනම පනත
- වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන්

*උපලේඛනය (සම්බන්ධිතයි)*

**(1) සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍ය** *(සම්බන්ධිතයි)*

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
| 16. උපලේඛනගත ශික්ෂණ රෝහල්හි සියලු දෙපාර්තමේන්තු හා සේවාවන් කළමනාකරණය හා සංවිධානය සහ ආශ්‍රිත උසස් වෛද්‍ය අධ්‍යාපන ආයතනයන් සමග කටයුතු සමායෝජනය | | |
| 17. සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ පර්යේෂණ අවස්ථා පුළුල් කිරීම සඳහා නව උපායමාර්ග හඳුන්වාදීම | | |
| 18. ත්‍රිපෝෂ බෙදාහැරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම | | |
| 19. මහජනතාවගේ සෞඛ්‍ය හා පෝෂණ තත්ත්වය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය වැඩසටහන් සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම | | |
| 20. පාරම්පරික වෛද්‍ය ක්‍රම සංරක්ෂණය සහ වැඩිදියුණු කිරීමට පියවර ගැනීම | | |
| 21. ආයුර්වේද, සිද්ධ, යුනානි හා හෝමියෝපති ඖෂධ නිෂ්පාදනය | | |
| 22. ආයුර්වේද, සිද්ධ, යුනානි සහ හෝමියෝපති වෛද්‍ය ක්‍රමවලට අවශ්‍ය අමු හා නිෂ්පාදිත ඖෂධ ආනයනය, විකිණීම හා බෙදාහැරීම | | |
| 23. ආයුර්වේද, සිද්ධ, යුනානි ආදි දේශීය වෛද්‍ය ක්‍රම වැඩිදියුණු කිරීම සඳහා අදාළ රෝහල්, පර්යේෂණ හා පුහුණු ආයතන සහ ඖෂධ වෙළඳසැල් පිහිටුවීම හා කළමනාකරණය | | |
| 24. ඖෂධ පැළැටි හා සකස්කළ ආයුර්වේද, සිද්ධ හා යුනානි ඖෂධ අපනයනය නියාමනය කිරීම | | |
| 25. ආයුර්වේද ඖෂධ නිෂ්පාදකයන් නියාමනය කිරීම | | |
| 26. ඖෂධ පැළැටි වගාව ප්‍රවර්ධනය කිරීම හා ආශ්‍රිත ව්‍යාපෘති කටයුතු | | |
| 27. ආයුර්වේද නිෂ්පාදකයන්, ආයුර්වේද වෛද්‍ය වෘත්තිකයන් හා ආයුර්වේද අතුරු වෛද්‍ය සේවක පිරිස් ලියාපදිංචි කිරීම | | |
| 28. ආයුර්වේද රෝහල්, ආයුර්වේද පර්යේෂණ ආයතන, පුහුණු ආයතන සහ ඔසුසල් පිහිටුවීම, මෙහෙයවීම සහ ප්‍රවර්ධනය | | |

*උපලේඛනය (සම්බන්ධිතයි)*

**(1) සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍ය** *(සම්බන්ධිතයි)*

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 29. දේශීය වෛද්‍ය සේවයේ පරිපාලනය සහ පිරිස් කළමනාකරණ කටයුතු | | |
| 30. ආයුර්වේද වෘත්තිකයින් සඳහා උසස් අධ්‍යාපන අවස්ථා ලබාදීම | | |
| 31. ආයුර්වේද, සිද්ධ, යුනානි සහ හෝමියෝපති වෛද්‍ය ක්‍රම සංවර්ධනය හා නියාමනය කිරීම | | |
| 32. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු | | |
| 33. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

**(2) මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍ය**

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 1. මහාමාර්ග හා මාර්ග සංවර්ධන විෂයයට සහ II වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම | 1. මාර්ග සංවර්ධන අධිකාරිය සහ එහි පාලිත සමාගම් හා ආශ්‍රිත සමාගම් | • ජාතික මංමාවත් පනත (2008 අංක 40) |
| 2. තුලිත සංවර්ධනයක් ඇතිවන ලෙස උසස් තත්ත්වයෙන් යුක්ත වන පරිදි ජාතික මහාමාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීම සහ ප්‍රශස්ථ තත්ත්වයෙන් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය පියවර ගැනීම | 2. මාර්ග නඩත්තු භාර අරමුදල | • මාර්ග සංවර්ධන අධිකාරිය පනත (1981 අංක 73) |
| 3. අධිවේගී මාර්ග පරිහරණ ගාස්තු නියම කිරීම, රැස්කිරීම සහ නියාමනය කිරීම | | • වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදාළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන් |
| 4. පළාත් සභා සහ පළාත් පාලන ආයතනවලට අයත් මාර්ග පිළිබඳ ජාතික ප්‍රතිපත්ති පදනම් කොටගත් වැඩසටහන් හා ව්‍යාපෘති සකස් කිරීම, එම වැඩසටහන් සහ ව්‍යාපෘති සම්බන්ධීකරණය හා මෙහෙයවීම | | |

*උපලේඛනය (සම්බන්ධිතයි)*

**(2) මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍ය** *(සම්බන්ධිතයි)*

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළ යුතු නීති හා අණ පනත්* |
| 5. II තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු | | |
| 6. II තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම | | |

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.